**ශීර්ෂය 158 - රාජ්‍ය ව්‍යවසාය කන්ද උඩරටඋරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

රාජ්‍ය ව්‍යවසාය කන්ද උඩරටඋරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසාය කන්ද උඩරට උරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසාය කන්ද උඩරට උරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අණාවරනය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇති වීමට හේතු වන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සපලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) මෙම වාර්තාවේ 1.6.1(ආ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයෙහි මා විසින් සිදුකරන ලද නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහාමාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති රු 64,500,000 ක වටිනාකමක් ඇති වාහන 3 ක් 2018 මාර්තු මාසයේ සිට අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදාගනිමින් පැවති අතර ඒවායේ අයිතිය පවරාගෙන ස්ථාවර වත්කම් සංචලන වාර්තාවට ඇතුලත් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | වාහන වල අයිතිය පවරාගෙන ස්ථාවර වත්කම් සංචලන වාර්තාවට ඇතුලත් කලයුතු වීම. | ඉදිරියේදී අගය කර ගිණුම් වලට ගැනීමට කටයුතු කරන බව |
| (ආ) | 2016 අගෝස්තු 3 දිනැති අංක 250/2016(1) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය ස්ථාපිත කර ඇති ගොඩනැගිලි පරිශ්‍රය සඳහා 2015 වර්ෂයේදී ගෙවන ලද රු. 22,351,352 ක් වූ මූලික තැන්පතුව එම වර්ෂයේදී වියදමක් ලෙස ලියාහැර තිබුණි | මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කල යුතුය | 2020 වර්ෂය තුල නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජය නිලධාරීන්ගේ අත්තිකාරම් අයකර ගැනීම් රු.2,816,973 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.409,020 ක් ලෙස දක්වා තිබුණි. | රජය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම අනුව මුදලින් ලද සියළු ලැබීම් හා ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කලයුතුය. | ණය වාරික හා පොලී ලැබීම් ලෙස රු. 409,020 ක් පමණක් ගත් බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදලින් කළ අත්තිකාරම් ගෙවීම වූ රු.5,054,375 සටහන් කර නොතිබුණි. | රජය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම අනුව මුදලින් ලද සියළු ලැබීම් හා ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඇතුලත් කලයුතුය. | තැන්පත් හා අනෙකුත් වගකීම් වල වෙනස් වීම් යටතේ ගලපා ඇති බව. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ----------------------------- |
| (අ) | **ඇප ලේඛනය**<br>-----------------<br>ඇප තැබිය යුතු නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇපලේඛනයක් පවත්වා ගතයුතුය. | ඇපලේඛනයක් පවත්වා නොමැති බව. |
| (ආ) | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව පුද්ගල පඩිනඩි ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව 17 වැනි භාණ්ඩාගාර හා විගණන ආකෘතිය පරිදි පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා ගත යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 වියදම් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ------------------------- |
| (අ) | වැය විෂයන් 08 ක් සඳහා එකතුව රු.197,650,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම වැය විෂයන්ට අදාල ප්‍රතිපාදන වලින් එකතුව රු. 69,885,524 ක් පමණක් උපයෝජනය කිරීම හේතුවෙන් රු. 127,764,476 ක් වියදම් නොකර ඉතිරිකර තිබුණි. එය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක වී තිබුණි. | කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදන උපයෝජනය කල යුතුවීම. | සැපයුම් කරන ලද භාණ්ඩ මිලදීගැනීම සිදුනොවීම ,ප්‍රාග්ධන ස්වරූපයේ අළුත්වැඩියාවන් සිදු නොවීම හා 5/2019 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් කලමනාකරණය කිරීමට සිදුවූ බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයන් 4 ක් සඳහා එකතුව රු50,650,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණද, එම වැය විෂයන්ට අදාලව කිසිදු වියදමක් දරා නොතිබුණි. ඉහත 158-1-2-3-2202 දරන වැය විෂය යටතේ කන්ද උඩරට උරුමය සංවර්ධනය සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2019 සැප්තැම්බර් රු.50,000,000 පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණද කාලය ප්‍රමාණවත් නොවීම හේතු වශයෙන් දක්වා කිසිදු සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. | 5/2019 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් කලමනාකරණය කිරීමට සිදුවූ බව හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------------

**3.1** **කාර්යසාධනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය සම්පත් කලමනාකරන සංස්ථාව වසර 05 ක් තුල කිසිදු කාර්යයක් ඉටුකර නොතිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 10 දිනැති අංක 2153/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය වෙත එම ආයතනය පවරා තිබුණි. | අමාත්‍යාංශය යටතේ පවතිව ව්‍යවස්ථාපිත ආයතන වලින් අපේක්ෂිත අරමුණු ඉටුකරවා ගත යුතු වීම | පිළිතුරු ලබාදී නොමැත |
| (ආ) | ලංකා පිඟන් සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම අමාත්‍යාංශයේ එක් කාර්යයක් වුවත්, වසර 05 ක් ගතවී තිබුණද සුදුසු ආයෝජකයින් තෝරා ගැනීමේ කටයුතු අවසන් නොවීම හේතුවෙන් ප්‍රතිව්‍යුහගතකරන කටයුතු ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. බී. සී. සී සමාගම සඳහාද ප්‍රතිව්‍යුහගතකරන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | අමාත්‍යාංශයේ කාර්යයන් පිළිබඳව දැඩි අවධානයක් යොමු කර ප්‍රමුඛ කාර්යයන් කඩිනමින් ඉටුකල යුතුවීම. | ප්‍රතිව්‍යුහගතකරන කටයුතු සිදුවෙමින් පවතින බව |
| (ඇ) | 2018 ජනවාරි 12 දිනැති අංක අමප/17/2758/733/047 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම, ශ්‍රී ලංකා කපු සංස්ථාව හා ගල්ඔය වැවිලි සමාගම යන වැවිලි සමාගම්වල ප්‍රතිව්‍යුහගතකරන | අමාත්‍යාංශය යටතට ගැනෙන කාර්යයන් කඩිනමින් ඉටුකර මහජන සේවාවන් කඩිනමින් ඉටුකල යුතුවීම. | භාණ්ඩාගාරයේ හා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත මුදල් ලබාගැනීම සිදු කල බව |

| | | | |
|---|---|---|---|
| | වැඩපිළිවෙල වහාම ක්‍රියාත්මක කල යුතු විය. එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එම කාර්යයන් ඉටුකර නොතිබුණි. තවද ප්‍රතිව්‍යුහගතකරනය සිදුකළ යුතු ආයතනයන් සඳහා රු.මි.3,004 ක වියදමක් වැටුප් හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් ගෙවීම පමණක් සිදුකර තිබුණි. | | |
| (ඈ) | වැව්ලි සමාගම් හා සම්බන්ධ ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් සඳහා මිනුම් පහසු කිරීම හා ඉඩම් සීමාවන් හඳුනාගැනීම පිණිස රු.මි.25 ක මුදලක් වාර්ෂික අයවැයෙන් වෙන් කර තිබුණ ද, ඉන් කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි. එසේම මිණුම්කරුවන් සොයා ගැනීමට හා මායිම් සළකුනු කිරීමට පමණක් උපදෙස් ලබා දීම සිදුකර තිබුණු අතර, කිසිදු ඉඩමක මිණුම් කටයුතු අවසාන කර නොතිබුණි. | අමාත්‍යාංශයට පැවරෙන කාර්යයන් කඩිනමින් ඉටුකිරීම මඟින් අපේක්ෂිත මහජන සේවාවන් ඉටුකල යුතු විම. | වැව්ලි සංස්ථාවේ සේවකයින් සඳහා පර්චස් 07 බැගින් ඉඩම් මැණුම් කර ඒ සඳහා රු මිලියන 1.5 ක් ගෙවා අවසන් බව |

**3.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කන්ද උඩරටට අයත් ප්‍රදේශවල සහ මහනුවර දිස්ත්‍රික්කය තුළ සමාජීය හා ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු 1,047,000,000 ක පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. එමඟින් ව්‍යාපෘති 1106 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.473,309,109 ක් වැයකර තිබුණි. තවදුරටත් ගෙවිය යුතු රු. 237,472,608ක් වූ බැරකම් සඳහා ප්‍රතිපාදන 2020 අගෝස්තු 31 දින තෙක් අනුමත වී නොතිබුණි. | තවදුරටත් ගෙවිය යුතු මුදල් ගෙවා අවසන් කලයුතුය. | පිළිතුරු ලබාදී නොමැත |
| (ආ) | මෙම ව්‍යාපෘතිය යටතේ අනුමත කළ ව්‍යාපෘති 1303 න් 950 ක් ම එනම් සියයට 73 ක් ම මහනුවර දිස්ත්‍රික්කය සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබුණි. ඉතිරි දිස්ත්‍රික්ක 05 සඳහාම අනුමත වූ ව්‍යාපෘති සංඛ්‍යාව 353 ක් පමණක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 27 ක් විය. | ව්‍යාපෘතිය යටතේ වන ප්‍රතිපාදන ආවරණය කල යුතු ක්ෂේත්‍ර විධිමත්ව හඳුනාගත යුතුවිම. | ව්‍යාපෘති යෝජනා කැඳවීමේදී බහුතර ව්‍යාපෘති යෝජනා මහනුවර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ඉදිරිපත් වූ බව |
| (ඇ) | කන්ද උඩරට ඓතිහාසික ස්ථාන වැඩිදියුණු කර සංචාරක ආකර්ෂණය ඇති කිරීම සඳහා ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර ව්‍යාපෘති 4 ක් පමණක් ක්‍රියාත්මක කර | සැලසුම්ගත ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගතයුතු වීම. | ව්‍යාපෘති දෙකක් ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් ඉතිරිකිරීම සඳහා අත්හැර ඇති බව හා එක් |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. මෙම ව්‍යාපෘති වලින් කිසිදු ව්‍යාපෘතියක වැඩ අවසන් කර නොතිබුණු අතර, නුවරඑළිය වැනි සංචාරක ආකර්ෂණයක් ඇති දිස්ත්‍රික්කය සඳහා ව්‍යාපෘති එකක් පමණක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වි නොතිබුණි. | | ව්‍යාපෘතියක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ජා කොට ක්‍රියාත්මත නොකල බව |
| (ඈ) | බදුල්ල දිස්ත්‍රික්කය තුල ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මත කිරීමට රු.3,200,000 ප්‍රතිපාදන නිදහස් කලද ව්‍යාපාති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන නැවත පවරාගෙන තිබුණි. | ප්‍රතිපාදන නිදහස් කිරීමට පෙර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සලකා බැලිය යුතුය. | එක් ව්‍යාපෘතියක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශ හා භාණ්ඩාගාර චක්‍රලේඛ වල සඳහන් උපදෙස් පරිදි රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමේ අරමුණෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකල බව හා අනෙක් ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය පරිදි ක්‍රියාත්මක නොකල බව |
| (ඉ) | ප්‍රතිපාදන නිදහස් කල රු.1,265,000 ක් වූ ව්‍යාපෘති 3 ක් සඳහා කන්ද උඩරට සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සභාපති හා අධ්‍යක්ෂකගේ නිර්දේශ නොමැති බැවින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශය මඟින් අත්හිටුවා, ක්‍රියාත්මක සැලැස්මෙන්ද ඉවත්කර තිබුණි. නමුත් ප්‍රතිපාදන නිදහස් කර තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන ආපසු පවරා ගැනිමට සිදුවී තිබුණි. | ප්‍රතිපාදන ලබාදීමට පෙර අවශ්‍ය නිර්දේශ ලබාගත යුතුය. | ව්‍යාපෘති සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදී නොමැති බැවින් ප්‍රතිපාදන නැවත පවරාගත් බව |
| (ඊ) | අන්‍යාගමික ස්ථානවල සංවර්ධනයට අදාල වන රු.2,500,000 ක් වු ව්‍යාපෘති 2ක් සඳහා ප්‍රතිපාදන නිදහස් කලද මෙම පල්ලි ලියාපදිංචි වි නොමැති බැවින් ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් නැවත ගෙන්වා ගෙන තිබුණි. | ප්‍රතිපාදන නිදහස් කිරීමට පෙර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සලකා බැලිය යුතුය. | මෙම අන්‍ය ආගමික ස්ථාන සංවර්ධනයට අදාල බැවින් හා එම ස්ථාන 2010 ට පෙර ලියාපදිංචිවී නොමැති නිසා ප්‍රතිපාදන නැවත පවරාගත් බව |

**3.3 අනාර්ථික ගණුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ------------ | ------------------------ |
| කන්ද උඩරට උරුමයට අදාළ පාරම්පරික ජන ක්‍රීඩා ඔප්නම්වමින් මහනුවර පැවති හරිත බක්මහ උළෙලේ සජීවි විකාශය හා පූර්ව ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ස්වාධින රූපවාහිණී සේවයට හා කඳුරට සේවයට රු.1,809,500 ක මුදලක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු වලට පරිබාහිර කටයුතු සඳහා රජයේ මුදල් වැය නොකල යුතුය. | උඩරටට ආවේනික සංස්කෘතික ජනක්‍රීඩා සමාජගත කිරීමේ අරමුණ ඇතිව ප්‍රචාරක කටයුතු සිදුකල බව |